# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1768/26 – 2012 ජූලි 27 වැනි සිකුරාදා – 2012.07.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරකන්ද ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ගා 2539 සහ 1993.08.14 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.810ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

01. කැබලි අංක 1

ඉඩමේ නම: මුල්කැටිය ඇළ අද්දර කුඹුරෙන් කොටසක්; ප්‍රමාණය: අක්කර. 01.

02. කැබලි අංක 2

ඉඩමේ නම: නරාවෙල හෙවත් හල්වතුර ඇළයාය කොටසක්; ප්‍රමාණය: අක්කර. 01.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 02 වැනි දින අ. භා. 2.00ට කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 සැප්තැම්බර් මස 26 වන දිනට මත්තෙන්, ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එන්. එස්. ටී. කේ. ද සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කරන්දෙණිය.

2012 ජූලි මස 23 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

08 – 366